**බදුල්ල දිස්ත්‍රික්කය ගොවිජන සේවා කාරක සභා 31 - 2023**

---

**1. විගණන මතය**

1.1 බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 31 ක 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන, මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 31 කට අදාලව නිකුත් කර තිබුණු විගණන වාර්තා 31 හි තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර ඇති අතර, තත්ත්වාගණනය කළ මතය සඳහා හේතු වී තිබුණු ප්‍රමාණාත්මක දෝෂ පහත දැක්වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන**

**1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ඇතුළත්ව ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවි බැංකුව, ගොවිජන සේවා කාරක සභාවේ ඒකකයක් වුවද බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 31 හි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. | ප්‍රධාන කාර්යාලයෙන් උපදෙස් ලබාගෙන ඉදිරියේදී කටයුතු කරන බව. | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතුය. |

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාරක සභා 13 ක් සතු ගොඩනැගිලි 21 ක, ඉඩම් 06 ක සහ වෙනත් වත්කම් 05 ක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | කාරක සභාවක් විසින් පිළිතුරු සපයා නොතිබුණු අතර කාරක සභා 12 ක් විසින් ඉදිරියේදී වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව | කාරක සභා සතු වත්කම්වල වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කල යුතුය. |
| (ආ) | කාරක සභා 26 ක වසර 4 සිට වසර 35 දක්වා කාල පරාසයක සිට අයවිය යුතු | කාරක සභා 02 ක් විසින් පිළිතුරු සපයා නොතිබුණු අතර කාරක සභා 24 ක් විසින් පරීක්ෂා කර | අයවිය යුතු බව තහවුරු කර ගත නොහැකි ශේෂයන් විධිමත් අනුමැතියක් යටතේ |

| | | | |
|---|---|---|---|
| | එකතුව රු.34,338,825 ක් වූ ගිණුම් ශේෂයන් 408 ක් අයකර ගැනීමට හෝ සුදුසු පරිදි කටයුතු කිරීමෙන් තොරව ණයගැතියන් ලෙස දක්වා තිබුණි. | බලා අදාල පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට හෝ එසේ නොහැකි නම් කපා හැරීමට කටයුතු කරන බව. | සුදුසු පරිදි කටයුතු කල යුතු අතර අය කර ගත හැකි ශේෂයන් අයකර ගත යුතුය. |
| (ඇ) | කාරක සභා 22 ක වසර 2 සිට වසර 37 දක්වා කාල පරාසයක සිට ගෙවිය යුතු එකතුව රු.51,971,341 ක් වූ ගිණුම් ශේෂයන් 261 ක් විධිමත් අනුමැතියක් ලබාගෙන සුදුසු පරිදි කටයුතු කිරීමෙන් තොරව ණයහිමියන් ලෙස දක්වා තිබුණි. | කාරක සභා 02 ක් විසින් පිළිතුරු සපයා නොතිබුණු අතර කාරක සභා 20 ක් විසින් පරීක්ෂා කර ලබා අදාල පාර්ශවයන් හඳුනා ගෙන ගෙවීම් කිරීමට හෝ එසේ නොහැකි නම් අනුමැතියක් ලබා ගෙන ශේෂයන් කපා හැරීමට කටයුතු කරන බව. | ශේෂ සනාථ කර ගැනීමෙන් පසු විධිමත් අනුමැතියක් යටතේ ණය ශේෂ සම්බන්ධව සුදුසු පරිදි කටයුතු කළ යුතු අතර, ගෙවිය යුතු ශේෂයන් පවතී නම් ඒවා කඩිනමින් ගෙවීම් කල යුතුය. |
| (ඈ) | කාරක සභා 02 ක වටිනාකම රු.496,559 ක්වූ භෞතිකව නොපවතින ට්‍රැක්ටර් රථයක් සහ ගරාජයක් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී සුදුසු පරිදි ගැලපීම් කරන බව. | සුදුසු පරිදි මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කල යුතුය. |
| (ඉ) | කාරක සභා 04 ක සමාලෝචිත වර්ෂය තුල මිලදීගෙන තිබුණු සහ ඉදි කරන ලද එකතුව රු.473,184 ක් වූ ස්ථාවර වත්කම්, ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත නොකර පුනරාවර්ථන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි මූල්‍ය ප්‍රකාශනවලදී නිවැරදිව ගිණුම්ගත කරන බව. | නිවැරදි වර්ගීකරණයන් සහිතව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතුය. |
| (ඊ) | කාරක සභා 12 ක වියදම් ප්‍රතිපූර්ණය කිරීම් රු.1,338,374 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | එක් කාරක සභාවක් විසින් පිළිතුරු සපයා නොතිබුණු අතර කාරක සභා 11 ක් විසින් ඉදිරි මූල්‍ය ප්‍රකාශන වලදී නිවැරදිව ගිණුම්ගත කරන බව. | ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කල යුතුය. |
| (උ) | නිකපොත ගොවිජන සේවා කාරක සභාවේ ආදායමක් හා වියදමක් නොවන සහනාධාර පොහොර සඳහා ගොවීන්ගෙන් ලද රු.1,148,649 ක් සහ ඒ වෙනුවෙන් ගොවිජන සේවා නියෝජ්‍ය කොමසාරිස් වෙත ගෙවන ලද රු.811,216 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් සහ වියදමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ඉදිරි මූල්‍ය ප්‍රකාශන වලදී නිවැරදිව ගිණුම්ගත කරන බව. | ආදායම් සහ වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඌ) | කාරක සභා 03 ක ජංගම වත්කම් වටිනාකම රු.769,774 ක් අඩුවෙන්ද කාරක සභා 03 ක ජංගම වත්කම් වටිනාකම රු.452,736 ක් වැඩියෙන්ද දක්වා තිබුණි. | ඉදිරි මූල්‍ය ප්‍රකාශනවලදී නිවැරදිව ගිණුම්ගත කරන බව. | නිවැරදි ජංගම වත්කම්වල වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කල යුතුය. |
| (එ) | කාරක සභා 04 ක ගිණුම්කරණ පද්ධතිය පරිගණකගත කිරීම සඳහා ලබා ගැනීමට නියමිත පරිගණක හා උපාංග සඳහා ගෙවා තිබුණු අත්තිකාරම් රු.1,155,905ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි මූල්‍ය ප්‍රකාශනවලදී නිවැරදිව ගිණුම්ගත කරන බව. | අත්තිකාරම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කල යුතුය. |

### 1.3.3 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 16 කට අදාල ගිණුම් විෂයයන් 88 ක මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම, අනුරූපී වාර්තා සමඟ සැසඳීමේදී රු.10,069,725 ක වෙනසක් නිරීක්ෂණය විය. | එක් කාරක සභාවක් විසින් පිළිතුරු සපයා නොතිබුණු අතර කාරක සභා 15 ක් විසින් ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | සැසඳීම් කර නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 04 ක ගොවි බැංකුව සහ කමිටුව අතර ගෙවිය යුතු සහ ලැබිය යුතු ශේෂයන් අතර රු.1,106,954 ක වෙනසක් නිරීක්ෂණය විය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | සැසඳීම් කර නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | කුඹල්වෙල ගොවිජන සේවා කාරක සභාව විසින් සමාලෝචිත වර්ෂයේ ජූලි සිට නොවැම්බර් මාසය දක්වා බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර නොතිබුණු අතර වර්ෂය අවසානයට මුදල් පොත සහ දෛනික ලැබීම් ලේඛනය අනුව මුදල් ශේෂය රු.854,745 ක් වුවද මූල්‍ය ප්‍රකාශන අනුව මුදල් ශේෂය රු.638,993 ක් වූයෙන් රු.215,752 ක වෙනසක් නිරීක්ෂණය විය. | රු.90,000 ක් පමණක් කමිටු ලිපිකරු විසින් බැංකු ගත කල බව. | සැසඳීම් කර නිවැරදි කිරීමට හෝ ඌනතාවයක් පවතී නම් ඊට අදාළව විධිමත් පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | නිකපොත ගොවිජන සේවා කාරක සභාව විසින් රාජ්‍ය බැංකු ශාඛාවක පවත්වාගෙන යන ජංගම ගිණුමේ ශේෂය මූල්‍ය ප්‍රකාශන, බැංකු සැසඳුම් ප්‍රකාශය සහ මුදල් පොත අනුව රු.3,709 ක් වුවද දෛනික මුදල් ලැබීම් ලේඛනයේ රු.643,368 ක් ලෙස රු.639,659 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී නිවරදි කිරීමට කටයුතු කරන බව | වෙනසට හේතුන් පරීක්ෂා කර නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. |

**1.3.4 අවිනිශ්චිත ගිණුම්**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 10 ක වර්ෂ 6 - වර්ෂ 26 අතර කාලයක සිට ඉදිරියට ගෙන එන අවිනිශ්චිත ගිණුම් හර ශේෂ වටිනාකම රු.1,085,427 ක් සහ කාරක සභා 05 ක වර්ෂ 09 ක පමණ කාලයක සිට ඉදිරියට ගෙන එන අවිනිශ්චිත ගිණුම් බැර ශේෂ වටිනාකම රු.1,252,723 ක් නිරවුල් කර නොතිබුණි. | කාරක සභා 02 ක් විසින් පිළිතුරු සපයා නොතිබුණු අතර අවිනිශ්චිත ගිණුම් හර ශේෂ පිළිබඳව කාරක සභා 08 ක් විසින්ද බැර ශේෂ පිළිබඳව කාරක සභා 04 ක් විසින්ද ඉදිරියේදී නිවැරදි කරන බව | අවිනිශ්චිත ගිණුම් නිරවුල් කිරීමට කටයුතු කළයුතුය. |

**1.3.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාරක සභා 18 ක එකතුව රු.24,515,935 ක්වූ වත්කම් ශේෂ 215 ක් සහ කාරක සභා 13 ක එකතුව රු.48,094,164 ක්වූ වගකීම් ශේෂ 140 ක් අදාල උපලේඛන, ස්ථාවර වත්කම් ලේඛන, ණයගැති හා ණයහිමි ලේඛන සහ ශේෂ සනාථ කිරීම් ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | කාරක සභා 02 ක් විසින් පිළිතුරු සපයා නොතිබුණු අතර කාරක සභා 16 ක් විසින් ඉදිරියේදී අවශ්‍ය කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂ සනාථ කිරීම සඳහා අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කල යුතුය. |

**1.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය සහ මුදල් රෙගුලාසි 133 සහ 134 | | කාරක සභා 20 ක සමාලෝචිත වර්ෂයට අදාලව අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | පිළිතුරු සපයා නොතිබුණි. | පනතේ විධිවිධාන සහ මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කල යුතුය. |
| (ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | | | | |
| (i) | මුදල් රෙගුලාසි 395 (ඇ) | | කාරක සභා 02 ක බැංකු ගිණුම් 02 ක් සඳහා සමාලෝචිත වර්ෂයට අදාලව බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි. | ඉදිරියේදී මුදල් රෙගුලාසි අනුව කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි වලට අනුකූලව කටයුතු කල යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 396 (ඇ) | 261,113 | කාරක සභා 05 ක් විසින් නිකුත් කර මාස 06 ඉක්මවූ ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් නොකල චෙක්පත් 13 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | එක් කාරක සභාවක් විසින් පිළිතුරු සපයා නොතිබුණු අතර කාරක සභා 04 ක් විසින් ඉදිරියේදී මුදල් රෙගුලාසි අනුව කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි වලට අනුකූලව කටයුතු කල යුතුය. |
| (iii) | මුදල් රෙගුලාසි 880 | | කාරක සභා 22 ක භාණ්ඩ, මුදල් භාරව කටයුතු කරන නිලධාරීන් 238 ක් | එක් කාරක සභාවක් විසින් පිළිතුරු සපයා නොතිබුණු අතර | - එම - |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | විසින් ඇප තැන්පත් කර නොතිබුණි. | කාරක සභා 21 ක් විසින් ඉදිරියේදී නියමිත පරිදි කටයුතු කරන බව | |
| (ඇ) | **ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛ** | | | | |
| (i) | 1986 ඔක්තෝබර් 21 දිනැති අංක 264 දරන චක්‍රලේඛයේ 1 ඡේදය | 2,241,662 | කාරක සභා 20 ක් විසින් සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවලට අදාලව ලැබිය යුතු කාමර කුලී අයකර ගෙන නොතිබුණි. | එක් කාරක සභාවක් විසින් පිළිතුරු සපයා නොතිබුණු අතර කාරක සභා 19 ක් විසින් අදාල ආයතන දැනුවත් කර කුලී අය කරන බව. | චක්‍රලේඛයේ විධිවිධාන පරිදි කටයුතු කර කාමරකුලී අයකරගත යුතුය. |
| (ii) | 2012 පෙබරවාරි 29 දිනැති අංක 04/2012 දරන චක්‍රලේඛය | | | | |
| | • 3.4.11 ඡේදය | | පස්සර ගොවිජන බැංකුවෙන් ණය ලබා ගත් ගොවීන් සඳහා ගොවි ආපදා ණය ආවරණ ගිණුමක් පවත්වාගෙන නොතිබුණි. | ඉදිරියේදී නිවැරදිව කටයුතු කරන බව | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කල යුතුය. |
| (iii) | 2014 අගෝස්තු 22 දිනැතිඅංක 07/2014 (අංක 107 සංශෝධන) දරන චක්‍රලේඛය | | දෛනිකව අත රඳවා ගත හැකි උපරිම මුදල වූ රු.10,000 ක් ඉක්මවා කාරක සභා 14 ක් විසින් අවස්ථා 502 කදී මුදල් අතරඳවාගෙන තිබුණි. | එක් කාරක සභාවක් විසින් පිළිතුරු සපයා නොතිබුණු අතර කාරක සභා 13 ක් විසින් ඉදිරියේදී නිවැරදිව කටයුතු කරන බව | - එම - |

| | | | | | |
|---|---|---|---|---|---|
| (iv) | 2018 මැයි 17 දිනැති අංක 7/5/2/1-2 (i) දරන චක්‍රලේඛය | 8,408,029 | රු.50,000 ට වැඩි ගෙවීම් වවුචර් සඳහා ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/ සහකාර කොමසාරිස්වරුන් අනු අත්සන් තැබිය යුතු වුවද මඩොල්සිම ගොවිජන සේවා කාරක සභාවේ වවුචර් 07 ක් සඳහා එසේ අනු අත්සන් තබා නොතිබුණි. | පිළිතුරු සපයා නොතිබුණි. | - එම - |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 31 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ සමස්ථ මෙහෙයුම් ප්‍රතිඵලය රු.18,577,744 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.6,314,286 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.12,263,458 ක වර්ධනයක් නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 05 ක රු.3,006,002 ක් වටිනා කෘෂි බීජ, කෘෂි රසායන සහ වෙනත් පොහොරද එක් ගොවිජන සේවා කාරක සභාවක වටිනාකම විගණනයට ඉදිරිපත් නොකෙරුණු පොහොර කිලෝග්‍රෑම් 94 ක්ද, එක් ගොවිජන සේවා කාරක සභාවක කාබනික දියර පොහොර ලීටර් 1,280 ක්ද කල් ඉකුත් වී තිබුණු නමුත් ඒ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පොහොර සම්බන්ධයෙන් පොහොර කමිටුවේ තීරණ අනුව කටයුතු කරන බව හා අනෙක් තොග සම්බන්ධව ඉදිරියේදී කටයුතු කරන බව. | අපහරණය කිරීමට හෝ සුදුසු පරිදි ඉවත් කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) | ගොවීන්ට නොමිලේ ලබාදීම සඳහා ගොවිජන සේවා කාරක සභා 04 ක් වෙත ලැබී තිබුණු ටී.එස්.පී පොහොර කිලෝග්‍රෑම් 3,600 ක් , එම්.ඕ.පී | අදාල ආයතන වෙත දැනුම් දී ඇතත් මේ වන තෙක් ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වී ඇති බව | කඩිනමින් උපදෙස් ලබාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කිලෝග්‍රෑම් 3,124 ක් සහ යූරියා කිලෝග්‍රෑම් 112 ක් බෙදා හැරීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ඇ) | කාරක සභා 17 කට අයත් ඉඩම්වල ප්‍රමාණයන් නිවැරදිව හඳුනාගෙන තිබුණද නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | එක් කාරක සභාවක් විසින් පිළිතුරු සපයා නොතිබුණු අතර කාරක සභා 17 ක් විසින් අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් ඉල්ලීම් කර ඇති බව. | ගොවිජන සේවා කාරක සභා සතු ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඈ) | ඇටැම්පිටිය ගොවිජන සේවා කාරක සභාව විසින් 2011 වර්ෂයේදී බදුල්ල වැලිමඩ මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා නිලඅතුගොඩ වසමේ රූඩ් 01 ක කුඹුරු ඉඩමක ගල් ඇඹරීමේ යන්ත්‍රයක් සවි කිරීම සඳහා පෞද්ගලික සමාගමකට අනුමැතිය ලබා දී තිබුණු අතර ව්‍යාපෘතිය අවසානයේ කුඹුර පෙර පැවති තත්ත්වයට සකස් කිරීමට අදාල සමාගමෙන් ලබාගෙන තිබුණු රු.290,443 ක තැන්පතුව අදාල කාර්යය සඳහා යොදා නොගෙන සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා රඳවා ගෙන තිබුණි. | කුඹුර යථා තත්ත්වයට පත්කර නොමැති බැවින් තැන්පත් නිදහස් කර නොමැති බව. | කුඹුර ඉඩම යථා තත්ත්වයට පත් කිරීමට කටයුතු කල යුතුය. |
| (ඉ) | කොටවෙර ගොවිජන සේවා කාරක සභාවට අනුයුක්තව සේවය කරමින් සිටියදී සිදුවූ පොහොර අයථා පරිහරණය සම්බන්ධයෙන් ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරියෙකු අවුරුදු 02 ක කාලයක් සඳහා අම්පාර දිස්ත්‍රික්කය වෙත ස්ථාන මාරු කිරීමට ලබාදී තිබූ විනය නියෝගය ක්‍රියාත්මක කර නොතිබුණි. | පිළිතුරු සපයා නොතිබුණි. | විනය නියෝග අප්‍රමාදව ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතුය. |
| (ඊ) | විනය නියෝග අනුව ගොවිජන සේවා කාරක සභා 05 ක සේවය කල නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු.12,429,435 ක් අයකර ගෙන නොතිබුණි. | පිළිතුරු සපයා නොතිබුණි. | විනය නියෝගයන් අනුව මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (උ) | කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරියෙකු 2023 | පිළිතුරු සපයා නොතිබුණි. | සේවයට වාර්තා නොකරන ලද නිලධාරියා |

| | | | |
|---|---|---|---|
| | සැප්තැම්බර් 13 දින සිට සේවයට වාර්තා කර නොමැති බව රිදීපාන ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී විසින් 2023 සැප්තැම්බර් 27 දින ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් වෙත දැනුම් දී තිබුණි. ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් විසින් එම නිලධාරියාගේ වැටුප් නතර කරන ලෙස ගණකාධිකාරි වෙත දන්වා ඇත්තේ 2024 පෙබරවාරි 09 දිනදී වූ අතර සේවයට වාර්තා නොකල නිලධාරියෙකු වෙනුවෙන් කඩිනම් පියවර ගැනීම වෙනුවට මාස 05 ක වැටුප් ලෙස රු.217,280 ක මුදලක් ගෙවා තිබුණි. | | වෙනුවෙන් ගෙවන ලද වැටුප් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඌ) | බත්මැඩිල්ල ගොවිජන සේවා කාරක සභාවේ ගොවිජන බැංකුවට අනුයුක්තව සේවය කල කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරයෙකු විසින් සිදු කරන ලද අයථා මුදල් පරිහරණය සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා නොතිබුණි. | පිළිතුරු සපයා නොතිබුණි. | විධිමත් පරීක්ෂණයක් පවත්වා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (එ) | බණ්ඩාරවෙල නගරයේ අලංකරණ කටයුතු සඳහා ශ්‍රම දායකත්වය ලබාදුන් ශ්‍රී ලංකා ගුවන් හමුදා භටයින් සඳහා 2021 දෙසැම්බර් 27 දින සිට 2023 ජනවාරි 31 දක්වා බණ්ඩාරවෙල ගොවිජන සංවර්ධන පුහුණු මධ්‍යස්ථානයේ නේවාසික පහසුකම් ලබාදීම වෙනුවෙන් බණ්ඩාරවෙල මහා නගර සභාවෙන් අයවිය යුතු රු.755,200 ක් අයකරගෙන නොතිබුණි. | පිළිතුරු සපයා නොතිබුණි. | අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඒ) | ගොවිජන සේවා කාරක සභා 03 ක සේවය කරන ලද කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් සිවු දෙනෙකු විසින් ආපසු භාර නොදෙන ලද අක්කර බදු කුවිතාන්සි පොත් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වීමට කමිටු පත් | පිළිතුරු සපයා නොතිබුණි. | විධිමත් පරීක්ෂණ පවත්වා ඒ අනුව සුදුසු ක්‍රියාමාර්ග ගැනීමත් පරීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කිරීමත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කර තිබුණද එම පරීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | | |
| (ඔ) | ගොවිජන සේවා කාරක සභා 05 ක නිලධාරීන් 05 දෙනෙකුගෙන් අයවිය යුතු රු.823,254 ක් අයකරගෙන නොතිබුණි. | පිළිතුරු සපයා නොතිබුණි. | අයවිය යුතු ශේෂයන් අයකර ගත යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාරක සභා 11 ක කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් 59 දෙනෙකු වෙත විකුණා මුදල් ගෙවීමේ පදනම මත සමාලෝචිත වර්ෂය තුල සහ ඊට පෙර වර්ෂයන්හිදී නිකුත් කර තිබුණු ද්‍රව්‍ය/උපකරණ වෙනුවෙන් අයවිය යුතු රු.7,128,910 ක් අයකර ගෙන නොතිබුණි. | ඉදිරියේදී අදාල මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව | අදාල මුදල් නොපමාව අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාරක සභා 06 ක් සතු ස්ථාවර වත්කම් 09 ක් වර්ෂ 02 ත් 08 ත් අතර කාලපරිච්ඡේදයක සිට භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | ඉදිරියේදී ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කරන බව. | වත්කම් ප්‍රශස්ථ ලෙස උපයෝජනය කල යුතුය. |
| (ආ) | කාරක සභා 02 ක අබලන් නිල නිවාස අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය දැනුවත් කර ඇති බව | අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කල යුතුය. |

**3.4 මානව සම්පත් කලමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා දිස්ත්‍රික් කාර්යාලය සහ ගොවිජන සේවා කාරක සභාවලට අදාල තනතුරු 10 ක සේවකයින් 235 ක පුරප්පාඩු පැවතිණි. | ඌණ කාර්ය මණ්ඩල සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යාලය දැනුවත් කර ඇති බව. | පුරප්පාඩු සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගතයුතුය. |

## 4. ගොවිජන බැංකු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1999 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දක්වා කාලය තුල කාරක සභා 30 ක් විසින් ගොවීන් 3,162 කට නිකුත් කරන ලද කෘෂි ණය මුදලින් රු.78,721,568 ක් , කාරක සභා 25 ක් විසින් ගොවීන් 492 කට නිකුත් කරන ලද ව්‍යාපෘති ණය මුදලින් රු.15,756,064 ක් , කාරක සභා 16 ක් විසින් ගොවීන් 387 කට නිකුත් කරන ලද ව්‍යවසායක ණය මුදලින් රු.10,812,343 ක් හා කාරක සභා 09 ක් විසින් ගොවීන් 38 කට නිකුත් කරන ලද කෘෂි උපකරණ සහ වෙනත් ණය මුදලින් රු.1,352,118 ක් ලෙස එකතුව රු.106,642,093 ක් ගිවිසුම් ප්‍රකාරව විධිමත්ව අයකර ගෙන නොතිබුණි. | කාරක සභා 02 ක් විසින් පිළිතුරු සපයා නොතිබුණු අතර කාරක සභා 28 ක් විසින් අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම, ගොවිජන විනිශ්චය සභාව වෙත යොමු කිරීම, කාර්යාල පරීක්ෂණ පැවැත්වීම සහ දැනුවත් කිරීම් ලිපි යොමු කිරීම මගින් අයකර ගැනීමට කටයුතු කරන බව. | අදාල ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර ණය මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |